# දැන්වීමයි

## <u>මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය - 2022/2023</u>

- 2022/2023 අධ්‍යයන වර්ෂයට අදාල මහපොළ ශිෂ්‍යත්වලාභි සිසුන්ගේ නාම ලේඛනය ශිෂ්‍ය සුබසාධක අංශ වෙබ් අඩවියේ (welfare.sjp.ac.lk) පළ කර ඇත.

- මහපොළ ශිෂ්‍යත්වය සඳහා තේරී පත්වී ඇති සිසුන් ඒ සඳහා ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචි වීමේ ආකෘති පත්‍රය <u>www.mahapola.lk</u> යන වෙබ් අඩවියට පිවිස <u>http://www.mahapola.lk/BankApp/</u> සබැඳිය හරහා ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කිරීමෙන් ලබාගත හැකිය.

- සම්පූර්ණ කරන ලද අයදුම්පත සෘජුවම (online) මහපොළ අරමුදල වෙත <u>2025.02.05</u> දිනට පෙර යොමු කළ යුතුය. (Online Submit කිරීම)

- **ඔබ බාගත කරන ලද ආකෘති පත්‍රයේ පිටපතක් <u>ඔබේ අත්සන යොදා ලියාපදිංචි අංකය පැහැදිලිව සටහන් කර</u> විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සුබසාධක අංශය වෙත <u>2025.02.10</u> දිනට පෙර බාර දිය යුතුය. බැංකු පාස් පොතේ පැහැදිලි ඡායා පිටපතක් හා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඒ සමග අමුණා තිබිය යුතු වේ.** ( E - පාස්පොත් ඇති සිසුන් තම ගිණුමට අදාල තොරතුරු සනාථ කිරීම සඳහා බැංකුවෙන් ලබාගන්නා ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය).

- ♦ **මෙම ගිණුම මහපොළ ශිෂ්‍යත්වලාභියාගේ නමට අයත් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ගිණුමක් විය යුතු අතර බද්ධ ගිණුමක් නොවිය යුතුයි.**

- ♦ **ඔබ විසින් ලබා දෙන බැංකු ගිණුම් අංකය පසුව වෙනස් කළ නොහැකි අතර <u>සක්‍රීය ගිණුම් අංකයක්</u> ඉදිරිපත් කළ යුතුවේ.** (Submit **කිරීමට ප්‍රථම ගිණුම් අංකය නිවැරදි දැයි නැවත දෙවරක් පරීක්ෂා කර බලන්න).**

- ♦ **<u>ගිණුම් අංකය පසුව වෙනස් කරනු ලබන සිසුන්ගේ මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් මහපොළ ශිෂ්‍යත්වභාර අරමුදල විසින් අත්හිටුවනු ලබයි.</u>**

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුබසාධක අංශය
2025.01.09

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුභසාධක අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ.